# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## අති විශේෂ
## අංක 1258/20 - 2002 ඔක්තෝබර් 18 වැනි සිකුරාද - 2002.10.18
## (ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)
## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය


## ආණ්ඩුවේ නිවේදන
## කාර්යාල සේවක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය

2002.03.30 වැනි දින අංක 1229/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2002.03.30 වැනි දින දරන ව්‍යවස්ථා සංග්‍රහය වෙනුවට පහත සඳහන් කාර්යාල සේවක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහය පළ කරනු ලැබේ.

පි. විරහන්දි,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

2002 ඔක්තෝබර් මස 03වැනි දින,
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ හා
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07

1. ක්‍රියාත්මක වන දිනය:

1991 .05.03 වැනි දින අංක 660/10 දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලදුව 1992.07.08 දින අංක 722/16 දරන ශ්‍රී ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ සංශෝධනය කරන ලද ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන යටතේ ගන්නා ලද හෝ දැනට ආරම්භ කර ඇති යම් ක්‍රියා මාර්ගයකට හානියක් නොවන පරිදි මෙම ව්‍යවස්ථා සංග්‍රහය 2001.11.26 දින සිට ක්‍රියාත්මක වනු ඇත. (ක්‍රියාත්මක වන දිනය වනුයේ අමාත්‍ය මණ්ඩල තිරණය ගනු ලබන දිනය වේ)

2. නිර්වචන:

1:1 ''ව්‍යවස්ථා සංග්‍රහය'' යන පදයෙන් අදහස් කරන්නේ කාර්යාල සේවක සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයයි.

1:2 ''අධ්‍යක්ෂ ජනරාල්'' යන පදයෙන් අදහස් කරන්නේ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ය

1:3 ''සේවය'' යන පදයෙන් අදහස් කරන්නේ කාර්යාල සේවක සේවයයි.

3. ව්‍යුහය:

පහත සඳහන් වාර්ෂික වැටුප් පරිමාණ සහිතව III පන්තියට සහ කාර්යාල මුරකරුවන් හා බයිසිකල් පණිවිඩකරුවන් වශයෙන් II පන්තියටද පත් කරනු ලබන හා කාර්යාල සේවක සේවයේII හා I පන්තිවලටද උසස් කරනු ලබන අයගෙන් ''සේවය'' සමන්විත වේ.

4:1 I පන්තිය - රු 45,180 - 23 X 1,320 - රු. 75540
II පන්තිය - රු 43,680 - 10 X 960 - 8 X 1,320 - රු. 63,840
III පන්තිය - රු 40,800 - 20 X 960 - රු 60,000

සටහන

සනීපාරක්ෂක කම්කරු තනතුරකට බඳවාගන්නා සේවකයෙකු තුන්වන පන්තියේ වැටුප් පරිමාණයේ රු. 42,720 ක වැටුප් පියවරේ තබනු ඇත

4:2 සේවයට බඳවාගන්නා නිලධාරීන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

5. සේවක සංඛ්‍යාව -

5:1 සේවක සංඛ්‍යාව ඒ ඒ අමාත්‍යාංශවල හා දෙපාර්තමේන්තුවල අවශ්‍යතාව අනුව තීරණය කළ යුතුය.

5:2 සේවක සංඛ්‍යාව වාර්ෂික ඇස්තමේන්තුවල ඒ ඒ ශීර්ෂ හා සම්මත යටතේ දැක්විය යුතුය.

5:3 සේවයට ඇතුළත් කර ඇති තනතුරු "ආ" උපලේඛනයේ දැක්වේ.

6. පාලනය

සේවය ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ පාලනයට යටත් වේ.

7. 11 පන්තියේ බයිසිකල් පණිවුඩකරුවන්, කාර්යාල මුරකරුවන් හා 111 පන්තියට අදළ සේවකයන් පත්කිරීම.

පහත 8 වන වගන්තියේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන අය සේවයේ 11 පන්තියට හා 111 පන්තියට බඳවා ගැනීම අමාත්‍යාංශ ලේකම්වරුන් හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් කරනු ඇත. ඒ සඳහා අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය ලබාගත යුතුවේ.

7:1 විධිමත් පත්වීම් ලිපි අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරනු ඇත.

8. බඳවා ගැනීමේ සුදුසුකම්:

ප්‍රසිද්ධ දැන්වීමකින් ඉල්ලුම් පත් කැඳවා පහත සඳහන් සුදුසුකම් සපුරාලන අය අතුරින් බඳවා ගන්නන් තෝරා ගනු ලැබේ.

8:1 ශ්‍රී ලාංකිකයෙකු විය යුතුය

8:2 ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 18 ට වැඩි විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

8:3 යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

8:4 අ.පො.ස.(සා.පෙළ) විභාගයෙන් එක් වරකදී, විෂයයන් 06 කට නොඅඩුව සම්මාන සාමාර්ථ දෙකක් සහිතව සමත්වී තිබිය යුතුය.

9. කාර්යක්ෂමතා කඩඉම:

111 පන්තියට හා 11 පන්තියට පත්වන අයට වසර තුනක් ඉකුත්වීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.

9:1 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පහත සඳහන් නිර්නායකයන් පදනම් කරගෙන කාර්යක්ෂමතාව මැනීම කළ යුතුය.

| | |
|---|---|
| කාර්යාල සේවක සේවයේ ඒ ඒ පන්තිවල අදළ කාර්යාල ක්‍රම හා විෂය පිළිබඳ දැනුම | - 40 |
| පැමිණීම, වැඩ, හැසිරීම | - 60 |
| එකතුව | 100 |

(සාමාර්ථය සඳහා අවශ්‍ය අවම ලකුණු ප්‍රමානය 40% කි)

9:2 නියමිත දිනට පෙර කාර්යාල සේවක සේවයේ කාර්යක්ෂමතා පරීක්ෂණ පැවැත්වීම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ වගකීමකි.

9:3 සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අදාල දෙපාර්තමේන්තු මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකු ද,වෙනත් දෙපාර්තමේන්තුවක මාණ්ඩලික නිලධාරියෙකුගෙන්ද සමන්විත විය යුතුය. කාර්යක්ෂමතා කඩඉම සමත්වීම පිලිබඳ සහතිකය අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කලයතුය.

9:4 සේවයේ ස්ථිර කිරීම සඳහා නියමිත කාර්යක්ෂමතා කඩඉමෙන් සමත් විය යුතුය.

10. II පන්තියට උසස් කිරීම

10:1 පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අවුරුදු 06 ක අඛණ්ඩ සේවා කාලයක් සහිත III පන්තියේ සේවය ස්ථිර කර ඇති නිලධාරීන් II පන්තියට උසස් කරනු ලැබේ.

(I) උසස්වීම් ඉල්ලුම්කරන දිනය පූර්වාසන්න අවුරුදු 05 තුල සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(II) පූර්වාසන්න වර්ෂ 02 තුල වැටුප් රහිත නිවාඩු ලබා නොතිබීම

(III) කාර්යක්ෂමතා කඩඉම සමත් වී තිබීම.

10:2 දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉහත අවශ්‍යතා සපුරාලන සේවකයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම් මගින් නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් පසු අධ්‍යක්ෂ ජනරාල් විසින් උසස්වීම් ලිපි නිකුත් කරනු ඇත.

11. I වන පන්තියට උසස් කිරීම:

11:1 පහත සඳහන් සුදුසුකම් සපුරාලන II පන්තියේ අවුරුදු 10 ක අඛණ්ඩ සේවා කාලයක් සහිත II පන්තියේ නිලධාරීන් I පන්තියට උසස් කරනු ඇත.

(I) උසස්වීම් ඉල්ලුම් කරන දිනට පූර්වාසන්න අවුරුදු 05 තුල සතුටුදයක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

(II) පූර්වාසන්න වර්ෂ 02 තුල වැටුප් රහිත නිවාඩු ලබා නොතිබීම.

11.2 දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් ඉහත අවශ්‍යතා සපුරාලන නිලධාරීන් සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම් මගින් නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් පසු අධ්‍යක්ෂ ජනරාල් විසින් උසස්වීම් නිකුත් කරනු ඇත.

12. රාජකාරි පැවරීම:

12:1 අදල සේවා අවශ්‍යතාවය ජ්‍යෙෂ්ඨතාවය, පළපුරුද්ද ආදිය පදනම් කරගෙන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් රාජකාරී පවරා දෙනු ඇත.

12:2 උසස්වීම් සිදු කරනු ලබන්නේ පුරප්පාඩු අනුව නොවන බැවින් එම පන්තියේම තනතුරක රාජකාරි පැවරීමට නොහැකි අවස්ථාවලදී වෙනත් පන්තියකට අයත් තනතුරක රාජකාරියේ යෙදවීමට දෙපාර්තමේන්තු ප්‍රධානියාට බලය ඇත.

සටහන:

I වන පන්තියට උසස්වීම් ලැබුණද උපලේඛනයේ සඳහන් වන I වන පන්තියේ තනතුරක පුරප්පාඩුවක් නොමැති විට II පන්තියේ තනතුරක වුවද රාජකාරි පැවරිය හැකිය.

12:3 සනීපාරක්ෂක කම්කරු තනතුරු හා මුරකරු තනතුරු සඳහා බඳවා ගත් අයට තනතුරු මාරු කිරීමට හිමිකම් නැත. ඔවුන්ට තනතුරු මාරුකල හැකි වන්නේ උසස්වීම් ලබා ගැනීමෙන් පසුව පමණි.

12:4 සනීපාරක්ෂක කම්කරුවන් වශයෙන් සේවයේ යෙදවිය හැක්කේ එම තනතුරකට බඳවා ගත් අය පමණි.

12:5 ඉහත 12:4 වගන්තියට යටත්ව මෙම සේවයට අයත් සෑම නිලධාරියෙක්ම සේවයේ ඕනෑම තනතුරක අදල නියමිත කාර්යය ඉටු කරීමට බැඳී ඇත.

13. සතුටුදයක සේවා කාලය පිලිබඳ අර්ථකථනය:

උස්සවීම් ඉල්ලුම් කරන දිනට පූර්වාසන්න වූ නියමිත කාලය තුල කළ වරදකට (අවවාද කිරීමකට හැර ) දඬුවමක් ලබා නැත්තාවූ නිලධාරියෙකු පමණක් සතුටුදයක සේවා කාලයක් ඇත්තෙකු සේ සළකනු ලැබේ.

14. සේවයේ නියුක්ත කිරීම්:

14:1 සේවයේ නිලධාරීන් ස්ථාන මාරු කරනු ලැබීමට යටත් වෙති. ඔවුන් දිවයිනේ කවර හෝ පෙදෙසකට පත්කර යැවීමට පුළුවන.

14:2 "අ" උපලේඛනයේ දක්වා ඇති තනතුරුවලට සේවයේ නිලධරයන් ස්ථාන මාරු කිරීම පහත පරිදි වේ.

14:2:1 අමාත්‍යාංශ අතර ස්ථාන මාරු කිරීම් අධ්‍යක්ෂ ජනරාල් විසිනි.

14:2:2 එකම අමාත්‍යාංශය තුළ දෙපාර්තමේන්තු අතර ස්ථාන මාරුකිරීම් අධ්‍යක්ෂ ජනරාල්ට දැනුම් දෙමින්, අදාල ලේකම් විසිනි.

14:2:3 එකම දෙපාර්තමේන්තුව ඇතුලත මාරුකිරීම් අධ්‍යක්ෂ ජනරාල්ට දැනුම් දෙමින් දෙපාර්තමේන්තු ප්‍රධානියා විසිනි.

15. සේවයේ නියුක්ත සේවකයන් නව ප්‍රතිස්ථාපිත සේවාවට අන්තර් ග්‍රහණය කිරීම.

15:1 වසර 06 කට වඩා අඩු සේවා කාලයක් ඇති 111 "අ" පන්තියේ නිලධාරීන් 111 පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15:2 නියමිත දිනට 111 හා 111"අ" පන්තිවල සේවයේ ස්ථිර කර සිටින හා සේවයේ වසර 06 ක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් කාර්යාල සේවක සේවයේ 11 පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15:3 නියමිත දිනට සේවයේ 11 පන්තියේ අවුරුදු 10 ක සේවා කාලයක් සම්පූර්ණ කර සිටින නිලධාරීන් කාර්යාල සේවක සේවයේ 1 පන්තියට අන්තර්ග්‍රහණය කරනු ලැබේ

ඉහත 15:1, 15:2 හා 15:3 යටතේ අන්තර්ග්‍රහණය කරනු ලබන්නේ 2001.11.26 දින සිට ක්‍රියාත්මක වන පරිදිය.

16. වෙනත් රෙගුලාසි:

මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට අමතරව ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හෝ නියෝගවලට ද, අනුකූලව ක්‍රියාකිරීමට සියළුම නිලධරයෝ බැඳී සිටිති.

17. විධිවිධාන සලසා නොමැති කරුණු:

මෙම ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන සලසා නැති කරුණු අධ්‍යක්ෂ ජනරාල් විසින් තිරණය කරනු ඇත.

"අ" උපලේඛනය - සේවයට අයත් තනතුරු

| පන්තිය | තනතුරු |
|---|---|
| 1 පන්තිය | ප්‍රධාන කාර්යාල කාර්ය සහායක (ආරච්චි) |
| | දුරකථන ක්‍රියාකරු |
| | ලේඛන භාරකරු |
| | පොත් බඳින්නා |
| | අනුපිටපත් යන්ත්‍ර ක්‍රියාකරු |
| | ඡායා පිටපත් යන්ත්‍ර ක්‍රියාකරු |
| 11 පන්තිය | කාර්යාල කාර්ය සහායක |
| | බයිසිකල් පණිවුඩකරු |
| | සෝපාන යන්ත්‍ර ක්‍රියාකරු |
| | පණිවුඩකරු |
| | කාර්යාල මුරකරු |
| 111 පන්තිය | කාර්යාල කම්කරු |
| | අමදින්නා |
| | උද්‍යාන කම්කරු |
| | සනීපාරක්ෂක කම්කරු |